# සමාජ සංවර්ධනය සඳහා දෙමාපියන්ගේ කාර්යභාරය පිළිබඳ බෞද්ධ අධ්‍යයනයක්

බලන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි[1]

## හැඳින්වීම

වත්මන් සමාජය ඉතා වේගයෙන් ආර්ථික අරමුණු කෙරෙහිම ගමන් කරයි. මෙහිදී යුතුකම්, වගකීම්, සදාචාර සංවර්ධනය, ආධ්‍යාත්මික ගුණ වගාව යන ගුණාංග රැසක්ම පුද්ගලයාගෙන් ගිලිහෙමින් පවතී. එහි විපාක වශයෙන් සමාජය නානාවිධ අපරාධවලින් පිරී පවතී. පුදගලයා විසින් ඉටුකළයුතු යුතුකම් මැනවින් ඉටු නොවීම මීට අදාළ ප්‍රධාන සාධකයකි මෙහිදී පූර්ව ආචාර්යවරුන් වශයෙන් මව්පියන් නිවැරදිව තම දරුවන්ට මග පෙන්විය යුතුය. එසේම දරුවන් වැඩිපුර සිටින පවුල් සංස්ථාව සමාජ සංවර්ධනයෙහිලා මහත් සේ හේතු වන බව සූත්‍ර දේශනා ඇසුරින් ද දැක්විය හැකිය. දීඝ නිකායෙහි සිගාලක සූත්‍රය සංයුක්ත නිකායේ කූටික සූත්‍රය හා අපුත්තක සූත්‍රය මීට නිදසුන් ය එසේම පුද්ගල පෞරුෂය හා බුදුදහමින් නිර්දේශිත පවුල් සංස්ථාව පෝෂණයෙහිලා ඉවහල් වන උපදේශ රාශියක්ම මෙම පර්යේෂණයට ඇතුළත් වේ.

## පර්යේෂණයේ අරමුණ.

- දෙමාපිය කාර්යභාරය, දූ දරු සබඳතාව හා පවුලෙහි කාර්භාරය පිළිබඳව වර්තමාන සමාජය තුළ විද්‍යාමාන වන අයහපත් ලක්ෂණ හඳුනාගැනීම.
- මව්පියන් තුළ පවත්නා දරුවන් අඩු පවුල වාසනාවන්ත බව, ඉගැන්වීම පළවෙනි යුතුකම බව, සීමා රහිතව දරුවන්ගේ කටයුතුවලට දෙමව්පියන් මැදිහත්වීම වැනි අයහපත් ආකල්ප බැහැරකරලීමට මග පෙන්වීම.
- පවුල පිළිබඳ බෞද්ධ සංකල්පය තුළින් ප්‍රකට වන සාධනීය ලක්ෂණ හඳුන්වාදීම.
- එම ලක්ෂණ ආශ්‍රිතව වර්තමාන සමාජය තුළ දෙමාපිය කාර්යභාරය සාධනීය ලෙස හැඩගැස්වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම.

1 ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. bacananda@yahoo.co.uk

UNIVERSITY ... 07 APR 20..

**පර්යේෂණ අවශ්‍යතාව**

අතිධාවනකාරීව ආර්ථික අරමුණු ජය ගැනීමට වෙර දරන සමාජය සැහැල්ලුවෙන් සද්ධර්මයට අනුව ජීවිත සාර්ථක කර ගැනීමට මග පෙන්වීම මෙම පර්යේෂනයේ අවශ්‍යතාවයයි. නොයෙක් අයුරින් විකෘති වී ඇති මිනිස් අවශ්‍යතා නිවැරදි කිරීම ද අතිරේක අවශ්‍යතාවයකි. පවුලෙහි හා දෙමව්පිය කාර්යභාරය පිළිබඳව වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය තුළ ගැටලු රැසක් පැන නැගී ඇති බව පැහැදිලිය. එම ගැටලු හේතු කොටගෙන සමාජීය, සංස්කෘතික හා ආගමික වශයෙන් අර්බුද ඇති බව දැක ගත හැකිය.

පවුල නම් වූ සමාජ ඒකකය කිසියම් ආකාරයකට විසංවිධානයකට පත්ව ඇති හෙයින් එකී තත්වයන් මගහරවාලීම උදෙසා බෞද්ධ දර්ශනයෙහි ප්‍රකට වන පවුල පිළිබඳ සංකල්පය හා දෙමාපිය දූදරු කාර්යභාරය පිළිබඳ සාධකයන්ගේ වැදගත්කම ශ්‍රී ලාංකේය සමාජයට හඳුන්වාදීමත් එම සංකල්පය මගින් ප්‍රකට වන ක්‍රියාකාරීත්වයන් කෙරෙහි දෙමාපියන් යොමුකරලීමත් කාලීන අවශ්‍යතාවක් සේ පර්යේෂකයා හඳුනා ගනියි. එහෙයින් මෙම පර්යේෂණය සිදුකරලීම ඉතා වැදගත් ශාස්ත්‍රීය කාර්යයක් මෙන්ම සමාජීය අවශ්‍යතාවයක් සපුරාලීමක් ද වන බව පර්යේෂකයා විශ්වාසය පළ කරයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණ ක්‍රමවේදය ලෙස සන්ධාර විශ්ලේෂණය භාවිත කෙරේ. පර්යේෂණ ක්ෂේත්‍රය වන්නේ සූත්‍ර පිටකයයි. අදාළ අර්ථකථා හා ටීකා ග්‍රන්ථ ආදිය ද අවශ්‍ය තැන්හිදී භාවිත කෙරේ. එසේම පර්යේෂණයට අදාළ ද්විතීයික මූලාශ්‍රයන් ද පරිශීලනයට ගැනේ.

**අන්තර්ගතය**

**විස්තෘත පවුල හා න්‍යෂ්ටික පවුලඃ**

සියලු ඥාති මිත්‍රාදීන්ගෙන් යුතු පවුල (විස්තෘත පවුල) හා මව්පියන් මෙන්ම දුව පුතා පමණක් සිටින පවුල (න්‍යෂ්ටික පවුල) යන ක්‍රම දෙකින් බුදුදහමට අනුගත පවුල් ක්‍රමය කුමක්දැ යි සාකච්ඡා කෙරේ.

**දෙමව්පියන්ගේ කාර්යභාරය හා සමාජ සංවර්ධනය**

දරුවන් බිහි කිරීම, ඔවුන්ට ඉගැන්වීම හා කටයුතු කරදීම දෙමව්පියන්ගේ පළමුවෙනි යුතුකම වශයෙන් බොහෝ දෙනෙක් සිතත්. බෞද්ධ සූත්‍රාගත

තොරතුරුවලට අනුව දරුවා පවින් වැළැක්වීම හා පිනෙහි යෙදවීම පළමු හා දෙවන යුතුකම්ය. මේ බව විස්තරාත්මකව මෙහිදී සාකච්ඡා කෙරේ.

**පුද්ගල පෞරුෂත්වය**

සීමාන්තිකව දරුවාගේ සියලු කටයුතු දෙමව්පියන් විසින් ඉටුකිරීම නිසා දරුවා තුළ ගොඩනැගිය යුතු පෞරුෂත්වය ශක්තිමත් නොවේ. විශේෂයෙන් තම ආත්මශක්තියට ගරු කරන බුදුදහම තුළ දැක්වෙන මිනිස් හැකියාව වර්ධනය කර ගැනීමට අවශ්‍ය උපදෙස් මෙහිදී සාකච්ඡා කෙරේ.

**බෞද්ධ ජීවිතය**

බුදුදහමින් නිර්දේශිත ලෞකික වශයෙන් සාර්ථක දැහැමි ජීවිතයක් ගත කරන ආකාරය හා අනවශ්‍ය ලෙසින් අවට පිරිස් අනුකරණය කිරීමට යෑම නිසා බෞද්ධ පවුල විනාශ වන බවද අවධාරණය කෙරේ.

**නිගමනය**

නිවැරදි පවුල් සංස්ථාව හඳුනාගෙන දෙමව්පියන් විසින් දරුවන් කෙරෙහි ඉටුකළ යුතු යුතුකම් මැනවින් සම්පූර්ණ කිරීමෙන් ගැටලු රැසක් විසඳා ගත හැකිය. එවිට දරුවා තම මව්පියන් කෙරෙහි මැනවින් ක්‍රියා කිරීමට නිරාසයෙන් ම පෙළඹෙනු ඇත. ඔවුනොවුන්ගේ යුතුකම් හා වගකීම් මනාලෙස ඉටුවන කල්හි සමාජය සංවර්ධනය කරා ගමන් කරන බව මෙම පර්යේෂණය මගින් නිගමනය කරයි.

**ප්‍රමුඛ පදඃ** විස්තෘත පවුල, සමාජ සංවර්ධනය, දෙමාපිය කාර්යභාරය, බෞද්ධ ජීවිතය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*දීඝ නිකාය.* (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘත මධ්‍යස්ථානය.

*සංයුක්ත නිකාය.* (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘත මධ්‍යස්ථානය.

*සංයුක්ත නිකාය.* (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘත මධ්‍යස්ථානය.

*Anguttaranikaya,* Part I, - (2005). Buddha Jayanti Tripitaka Series, Dehiwala: Buddhist Cultural Centre.